# දින 100 න් පසු ජනතා තීන්දුව ගැන කිසිම බියක් නෑ
- අගමැති රනිල් වික්‍රමසිංහ

අකිත පෙරේරා

දින සියයේ වැඩපිළිවෙළ කිසිවකුටත් ප්‍රාණ ඇපයේ තබා ගැනීමට ඉඩ දිය නොහැකි බවත් මීළඟ ජනතා තීන්දුව පිළිබඳව තමාට නම් කිසිදු බියක් හෝ සැකයක් නැති බවත් අගමැති රනිල් වික්‍රමසිංහ මහතා පැවසිය.

මහජන නියෝජිතයන් වෙනුවෙන් පොදු නිර්ණායක පද්ධතියක් සකසා එය "සාධනීය දේශපාලන සංස්කෘතියක් උදෙසා මාර්තු 12 ප්‍රකාශය නමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී ඊයේ (12 වැනිදා) එළිදැක්වූ අවස්ථාවේදී ඊට සහභාගිවෙමින් හෙතෙම මේ බව කීය.

දින සියයේ වැඩපිළිවෙළට පසුගිය ජනාධිපතිවරණයේදී ජනතා අනුමැතිය හිමි වූ බවත් එහි කටයුතු ආණ්ඩුව විසින් සිදු කරගෙන යන අතර එහි කාලය අවසන් වූ පසුව එය කිසිවකුටත් ප්‍රාණ ඇපකරුවකු වශයෙන් තබා ගැනීමට තමා විරුද්ධ බවත් ඒ මහතා සඳහන් කළේය.

එහි කාලය අවසන් වූ පසුව නැවතත් තීරණයක් ගැනීමට ජනතාවට අවස්ථාවක් දිය යුතු බවත් එම ජනතා පියවර පිළිබඳව තමාට නම් කිසිම බියක් හෝ සැකයක් නැති බවත් අගමැතිවරයා මෙහිදී ප්‍රකාශ කළේය.